# මුදල් සහ බැංකු කටයුතු

## මුදල් සැපයුම

1987 වසරේදී විවිධ මූල්‍ය සමස්තයන්හි වර්ධනය සැළකිය යුතු ලෙස වැඩි විය. 1987 වසරේ මූල්‍ය අංශයේ සිදුවීම් පිළිබඳව දක්නට වූ ප්‍රධාන ලක්ෂණයන් වූයේ දේශීය ණය ප්‍රසාරණයෙහි ඉහළ වර්ධන අනුපාතිකය සහ ආසන්න මුදල්හි වර්ධනය නැවත ඇති වීමත්ය. මහජනයා සතු ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු වලින් සමන්විත වන පටු මුදල් සැපයුම ($M_1$) 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 2,418 ක හෙවත් සියයට 13 ක ප්‍රසාරණය සමග සසඳන විට, 1987 දී රුපියල් දශ ලක්ෂ 3,904 කින් හෙවත් සියයට 18 කින් වර්ධනය විය. මේ අතර, වාණිජ බැංකු වෙතැති මහජනයා සතු කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු (ආසන්න මුදල්) රුපියල් දශ ලක්ෂ 3,571 කින් ප්‍රසාරණය විය. ඒ අනුව යමින්, $M_1$ සහ ආසන්න මුදල් එකතුව ලෙස නිර්වචනය කෙරෙන පුළුල් මුදල් සැපයුම ($M_2$) පසුගිය වර්ෂයේදී වූ රුපියල් දශ ලක්ෂ 2,451 ක හෙවත් සියයට 5 ක වර්ධනයක් සමග සසඳන විට රුපියල් දශ ලක්ෂ 7,475 කින් හෙවත් සියයට 15 කින් තියුණු ලෙස වර්ධනය විය.


$M_1$ හි කොටස් වන ව්‍යවහාර මුදල් සහ ඉල්ලුම් තැන්පතු යන දෙකම 1987 දී තියුණු වර්ධනයන් වාර්තා කළේය. ව්‍යවහාර මුදල් කොටස රුපියල් දශ ලක්ෂ 1,925 කින් හෙවත් සියයට 17 කින් වැඩි වූ අතර, ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,979 ක හෙවත් සියයට 21 ක වර්ධනයක් වාර්තා කළේය. ව්‍යවහාර මුදල් හා සැසඳීමේදී ඉල්ලුම් තැන්පතු සම්බන්ධිතව දක්නට වූ මඳක් ඉහළ වර්ධනය $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස සුළු වශයෙන් වැඩි කිරීමකට හේතු වූයෙන්, 1987 අවසානය වනවිට $M_1$ හි ඉල්ලුම් තැන්පතු කොටස එක් ප්‍රතිශත අංකයකින් වැඩි වී සියයට 46 ක් විය. කෙසේ වුවද, ව්‍යවහාර මුදල් සඳහා මහජන ඉල්ලුම, විශේෂයෙන් රුපියල් 1,000 සහ රුපියල් 500 නෝට්ටු සඳහා ඉල්ලුම තවදුරටත් ඉහළ මට්ටමක පැවතුනේ ගණුදෙනුවලදී ඉහළ වටිනාකමින් යුත් එම මුදල් නෝට්ටු භාවිතයට ගැනීම වැඩි වීම මෙන්ම, උතුරු හා නැගෙනහිර පළාත්වල සාමාන්‍ය බැංකු සේවා අඩපන වීමද පිළිබිඹු කරමිනි. මුළු ව්‍යවහාර මුදල් නිකුතුවෙන් මෙම මුදල් නෝට්ටු සතු කොටස 1986 අවසානයට වූ සියයට 56 සිට 1987 අවසානය වනවිට සියයට 61 දක්වා වැඩි විය.

1986 දී වූ රුපියල් දශ ලක්ෂ 33 ක සුළු වැඩි වීම සමග සසඳන කල, 1987 දී ආසන්න මුදල් රුපියල් දශ ලක්ෂ 3,571 කින් හෙවත් සියයට 12 කින් වැඩි වුණි. මෙම වර්ධනය විශාල වශයෙන් පිළිබිඹු වූයේ රුපියල් දශ ලක්ෂ 3,384 කින් හෙවත් සියයට 14 කින් වැඩි වූ අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන්ගේ එනම්; නියම පෞද්ගලික අංශයේ, කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු තුළිනි. මෙම වර්ධනයෙන් සියයට 50 කටත් වඩා වැඩි වූයේ වසරේ අවසාන කාර්තුව තුළදීය. රුපියල අවප්‍රමාණයවීම හේතුකොටගෙන අපනයන මිලෙහි රුපියල් අගය ඉහළව පැවතීමත්, බැංකුවල සහ අනෙකුත් තරඟකාරී ආයතනවල පොළී අනුපාතික අතර පරතරය පටුවීමත් මෙම කාලච්ඡේදය තුළදී පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු සැළකිය යුතු ලෙස වර්ධනය වීමට දායක වූ ප්‍රධාන සාධකයන් විය. රාජ්‍ය සංස්ථාවල කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු, පසුගිය වසරේදී වූ රුපියල් දශ ලක්ෂ 1,067 ක තියුණු පහත වැටීම හා සසඳන විට, රුපියල් දශ ලක්ෂ 119 ක සුළු වැඩි වීමක් වාර්තා කළේය. මෙයට සමානව, සමුපකාර ආයතනවල කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 69 කින් වැඩි විය.

පුළුල් මුදල් සැපයුමෙහි සියළුම උප කොටස් වර්ධනයන් වාර්තා කළෙන්, $M_2$ හි වර්ධන වේගය 1986 පැවති සියයට 5 ක අඩු මට්ටමක සිට 1987 දී සියයට 15 දක්වා වැඩි විය. මෙම මූල්‍ය සමස්තයෙහි මාසික වෙනස්වීම් වලින් පෙන්නුම් කෙරෙන පරිදි එහි වාර්ෂික වර්ධන අනුපාතිකය වර්ෂය පුරාම දිගටම වේගවත් වෙමින් වර්ෂය අවසානය වනවිට සියයට 15 ක ඉහළම මට්ටමකට පත් විය.

## මුදල් සැපයුම

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 46 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් 1985 – 1987

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ වලිනි

| කාලච්ඡේදය අවසානයේදී | පටු මුදල් සැපයුම($M_1$) | | | | | | පුළුල් මුදල් සැපයුම($M_2$) | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1985 | 1986 | 1987 | වෙනස % 1984/1985 | වෙනස % 1985/1986 | වෙනස % 1986/1987 | 1985 | 1986 | 1987 | වෙනස % 1984/1985 | වෙනස % 1985/1986 | වෙනස % 1986/1987 |
| ජනවාරි .. | 16,522 | 18,456 | 21,845 | + 10·4 | + 11·7 | + 18·4 | 43,923 | 48,498 | 51,887 | + 14·8 | + 10·4 | + 7·0 |
| පෙබරවාරි .. | 16,595 | 19,062 | 21,738 | + 11·1 | + 14·9 | + 14·0 | 44,849 | 48,587 | 52,799 | + 14·9 | + 8·3 | + 8·7 |
| මාර්තු .. | 17,237 | 20,454 | 22,556 | + 11·7 | + 18·7 | + 10·3 | 45,230 | 49,410 | 53,855 | + 13·8 | + 9·2 | + 9·0 |
| අප්‍රේල් .. | 17,332 | 20,287 | 22,121 | + 13·2 | + 17·1 | + 9·0 | 46,019 | 49,335 | 53,278 | + 16·1 | + 7·2 | + 8·0 |
| මැයි .. | 17,208 | 20,043 | 22,305 | + 20·1 | + 16·5 | + 11·3 | 46,092 | 49,119 | 53,972 | + 17·8 | + 6·6 | + 9·9 |
| ජුනි .. | 17,339 | 19,949 | 22,075 | + 17·4 | + 15·1 | + 10·7 | 46,233 | 48,959 | 53,942 | + 16·5 | + 5·9 | + 10·2 |
| ජූලි .. | 16,969 | 19,615 | 22,574 | + 13·9 | + 15·6 | + 15·1 | 46,631 | 48,882 | 54,624 | + 17·6 | + 4·8 | + 11·7 |
| අගෝස්තු .. | 17,232 | 19,731 | 23,160 | + 16·4 | + 14·5 | + 17·4 | 46,991 | 48,771 | 55,236 | + 18·2 | + 3·8 | + 13·3 |
| සැප්තැම්බර් .. | 17,460 | 20,399 | 22,973 | + 12·3 | + 16·8 | + 12·6 | 47,917 | 49,430 | 55,927 | + 17·4 | + 3·2 | + 13·1 |
| ඔක්තෝබර් .. | 17,768 | 20,219 | 23,143 | + 10·8 | + 13·8 | + 14·5 | 48,359 | 49,868 | 56,560 | + 16·3 | + 3·1 | + 13·4 |
| නොවැම්බර් .. | 18,187 | 20,293 | 23,551 | + 16·0 | + 11·6 | + 16·1 | 47,247 | 50,057 | 56,916 | + 12·5 | + 6·0 | + 13·7 |
| දෙසැම්බර් .. | 18,761 | 21,179 | 25,083 | + 11·5 | + 12·9 | + 18·4 | 48,409 | 50,860 | 58,335 | + 11·4 | + 5·1 | + 14·7 |
| මාසික සාමාන්‍යය .. | 17,384 | 19,974 | 22,760 | + 13·7 | + 14·9 | + 14·0 | 46,492 | 49,315 | 54,778 | + 15·6 | + 6·1 | + 11·1 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1987 දී $M_2$ හි වර්ධනය සඳහා බලපෑ ප්‍රධාන සාධකය වූයේ ණය දීම් සැළකිය යුතු ලෙස වැඩි වීමයි. 1987 දී දේශීය ණය ප්‍රසාරණය රුපියල් දශ ලක්ෂ 11,457 ක් හෙවත් සියයට 18 ක් වන අතර, මේ හා සැසඳීමේදී 1986 දී රුපියල් දශ ලක්ෂ 4,883 ක හෙවත් සියයට 8 ක වැඩි වීමක් දක්නට විය. බැංකු ක්‍රමය මගින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 4,502 කින් හෙවත් සියයට 20 කින් වැඩි වීමෙන් සහ වාණිජ බැංකු වලින් පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 6,955 කින් හෙවත් සියයට 17 කින් ප්‍රසාරණය වීමෙන් දේශීය ණය වර්ධනය සමන්විත විය. මේ හා සැසඳීමේදී, රජයට දෙන ලද ශුද්ධ ණය සහ පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය වර්ධනයන්හි පසුගිය වසරේ සංඛ්‍යා පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,198 ක් හෙවත් සියයට 11 ක් සහ රුපියල් දශ ලක්ෂ 2,684 ක් හෙවත් සියයට 7 ක් විය. මුළු දේශීය ණයෙහි රජයට දෙන ලද ශුද්ධ ණය සතු කොටස 1986 දී වූ සියයට 35 සිට 1987 දී සියයට 36 දක්වා වැඩිවීම තුළින් එම ණය වර්ධනය පිළිබිඹු විය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වූ වගකීම් ප්‍රති ඇගයීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට වූ බැඳීම් පියවීම සඳහා මහ බැංකුවෙන් ලබා ගත් රුපියල් දශ ලක්ෂ 683 ක විශේෂ ණයක්ද, රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 4,502 ක වැඩි වීමෙහි ඇතුළත්ව ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය. මෙම විශේෂ ණය මුදල වර්ෂය තුළ සාමාන්‍ය අයවැය කටයුතුවලට සම්බන්ධ කළ හැකි නොවේ.


ප්‍රධාන වශයෙන් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන මගින්, රජයට දෙන ලද ශුද්ධ ණය ප්‍රසාරණයෙන් විශාලතම කොටසකට වාණිජ බැංකු දයක විය. 1987 තුළදී වාණිජ බැංකු විසින් රජයට දෙන ලද ශුද්ධ ණය රුපියල් දශ ලක්ෂ 3,035 කින් වැඩි විය. 1987 අගෝස්තු මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය අඩු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ද්‍රවශීලතා ප්‍රසාරණයක් ඇති වූ අතර සිය කෙටිකාලීන අරමුදල් යෙදවීම සඳහා ආකර්ශණීය ආයෝජන මාධ්‍යයක් ලෙස භාණ්ඩාගාර බිල්පත් තවදුරටත් වාණිජ බැංකු විසින් යොද ගැණුනි. මේ අතර, වර්ෂය තුළදී මහ බැංකුවෙන් රජයට දෙන ලද ශුද්ධ ණය වැඩි වීම රුපියල් දශ ලක්ෂ 1,468 කට හෙවත් සියයට 6 කට සීමා විය. පසුගිය වර්ෂයේදී මෙන්ම, 1987 පෙබරවාරි මාසයේදී මහ බැංකුවේ ලාභ වලින් රුපියල් දශ ලක්ෂ 1,723 ක් රජය වෙත පැවරීම මහ බැංකුවෙන් රජය ලබා ගත් ණය මෙම මට්ටමේ තබා ගැනීමට උපකාරී විය.

වසර තුළදී වූ පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය රුපියල් දශ ලක්ෂ 6,955 කින් වූ වර්ධනයෙන් වැඩි කොටසක් අනෙකුත් පෞද්ගලික අංශයේ ණයදෙනු කරුවන් සම්බන්ධයෙන් විය. 1986 දී වූ රුපියල් දශ ලක්ෂ 2,263 ක හෙවත් සියයට 7 ක වර්ධනයත් සමග සසඳන විට අනෙකුත් පෞද්ගලික අංශයේ ණයදෙනු කරුවන්ට දෙන ලද වාණිජ බැංකු ණය 1987 දී රුපියල් දශ ලක්ෂ 4,629 කින් හෙවත් සියයට 13 කින් වර්ධනය විය. වර්ෂය තුළදී පෞද්ගලික අංශයට දෙන ලද දළ ණයෙහි මුළු වර්ධනයෙන් තුනෙන් දෙකක් පමණ අනෙකුත් පෞද්ගලික අංශයේ ණයදෙනු කරුවන් සඳහා විය. මෙම වැඩි වීමෙන් භාගයකටත් වඩා වසරේ අවසාන කාර්තුවට අදළ විය. වඩා සතුටුදයක වූ මිළ ගණන් හේතු කොටගෙන අපනයන ණය සඳහා ඉල්ලුම වැඩි වීමද, ආනයන හා ඒ සම්බන්ධිත වෙළෙඳ කටයුතු සඳහා වැඩි වූ රුපියල් පිරිවැය පියවීම සඳහා වැඩිපුර ණය දීමද මගින් පෞද්ගලික අංශයේ ණය භාවිතය ඉහළ මට්ටමක පැවතීම පිළිබිඹු විය. අනෙකුත් පෞද්ගලික අංශයේ ණයදෙනුකරුවන්ට දෙන ලද ණය ප්‍රධාන වශයෙන් වසර තුළ, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 2,860 කින් හා රුපියල් දශ ලක්ෂ 1,318 කින් වැඩි වූ ණය හා අයිරා ස්වරූපය ගන්නා ලදී.

1987 දී රාජ්‍ය සංස්ථාවලට දෙන ලද වාණිජ බැංකු ණය රුපියල් දශ ලක්ෂ 2,627 කින් හෙවත් සියයට 55 කින් සැළකිය යුතු ලෙස වර්ධනය විය. මේ හා සැසඳීමේදී මෙම අංශයට දුන් ණය 1986 දී රුපියල් දශ ලක්ෂ 301 කින් සහ 1985 දී රුපියල් දශ ලක්ෂ 290 කින් සුළු වශයෙන් වැඩි විය. 1987 දී සැළකිය යුතු ණය වර්ධනයන් වාර්තා කළ රාජ්‍ය සංස්ථා නම් රාජ්‍ය වැවිලි සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 288), ජනතා වතු සංවර්ධන මණ්ඩලය (රුපියල් දශ ලක්ෂ 353),

# දේශීය ණය

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව,

## 1 . 47 සංඛ්‍යා සටහන

## මූල්‍ය සමස්තයන් සහ ඒවාට තුඩු දුන් සාධක

ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ වලින්

| ශීර්ෂය | 1985 දෙසැම්බර් | 1986 දෙසැම්බර් | 1987 දෙසැම්බර් | 1985/1986 වෙනස | | 1986/1987 වෙනස | |
|---|---|---|---|---|---|---|---|
| | | | | ප්‍රමාණය | සියයට ගණන | ප්‍රමාණය | සියයට ගණන |
| **මූල්‍ය සමස්තයන්** | | | | | | | |
| 1. මහජනයා වෙතැති ව්‍යවහාර මුදල් .. | 9,815·5 | 11,570·0 | 13,495·3 | + 1,754·4 | +17·9 | + 1,925·3 | + 16·6 |
| 2. මහජනයා වෙතැති ඉල්ලුම් තැන්පතු .. | 8,945·5 | 9,609·3 | 11,588·0 | + 663·8 | + 7·4 | + 1,978·8 | + 20·6 |
| **පටු මුදල් සැපයුම ($M_1$)** .. | **18,761·0** | **21,179·3** | **25,083·3** | + **2,418·2** | +**12·9** | + **3,904·1** | + **18·4** |
| 3. වාණිජ බැංකු වෙතැති පෞද්ගලික අංශයේ කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු .. | 29,647·9 | 29,681·0 | 33,251·7 | + 33·2 | + 0·1 | + 3,570·6 | + 12·0 |
| 3·1 සමුපකාර ආයතන .. | 633·5 | 702·2 | 770·6 | + 68·7 | +10·8 | + 68·5 | + 9·7 |
| 3·2 රාජ්‍ය සංස්ථා .. | 5,809·5 | 4,742·1 | 4,860·8 | − 1,067·3 | − 18·4 | + 118·6 | + 2·5 |
| 3·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනුකරුවන් (අ) .. | 23,204·9 | 24,236·7 | 27,620·3 | + 1,031·8 | + 4·4 | + 3,383·5 | + 13·9 |
| **පුළුල් මුදල් සැපයුම ($M_2$)** .. | **48,408·9** | **50,860·3** | **58,335·0** | + **2,451·4** | + **5·1** | + **7,474·7** | + **14·7** |
| **තුඩුදුන් සාධක** | | | | | | | |
| 1. දේශීය ණය .. | 59,226·1 | 64,108·8 | 75,565·5 | + 4,882·7 | + 8·2 | +11,456·6 | + 17·9 |
| 1·1 රජයට දෙන ලද ශුද්ධ ණය .. | 20,347·6 | 22,546·1 | 27,047·9 | + 2,198·5 | +10·8 | + 4,501·8 | + 20·0 |
| 1·1·1 රජයට දෙන ලද දළ ණය .. | 25,657·9 | 27,599·4 | 31,518·6 | + 1,941·5 | + 7·6 | + 3,919·3 | + 14·2 |
| මහ බැංකුව විසින් .. | 22,760·6 | 24,846·0 | 26,156·8 | + 2,085·5 | + 9·2 | + 1,310·8 | + 5·3 |
| වාණිජ බැංකු විසින් .. | 2,897·3 | 2,753·4 | 5,361·8 | − 144·0 | − 5·0 | + 2,608·5 | + 94·7 |
| 1·1·2 රජයේ තැන්පතු සහ මුදල් ශේෂ .. | − 5,310·3 | − 5,053·3 | − 4,470·7 | + 257·0 | + 4·8 | + 582·5 | + 11·5 |
| 1·2 පෞද්ගලික අංශයට දෙන ලද දළ ණය .. | 38,878·5 | 41,562·7 | 48,517·6 | + 2,684·2 | + 6·9 | + 6,954·8 | + 16·7 |
| 1·2·1 සමුපකාර ආයතන .. | 1,304·3 | 1,424·5 | 1,123·4 | + 120·2 | + 9·2 | − 301·1 | − 21·1 |
| 1·2·2 රාජ්‍ය සංස්ථා .. | 4,437·9 | 4,738·5 | 7,365·7 | + 300·6 | + 6·8 | + 2,627·2 | + 55·4 |
| 1·2·3 අනෙකුත් පෞද්ගලික අංශයේ ගණුදෙනු කරුවන් (අ) | 33,136·3 | 35,399·7 | 40,028·5 | + 2,263·4 | + 6·8 | + 4,628·7 | + 13·1 |
| 2. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) .. | 9,272·7 | 8,859·1 | 8,416·1 | − 413·6 | − 4·5 | − 443·0 | − 5·0 |
| 3. අනෙකුත් ශීර්ෂ (ශුද්ධ) .. | − 20,089·9 | −22,107·6 | −25,646·6 | − 2,017·7 | − 10·0 | − 3,538·9 | − 16·1 |
| 3·1 මහ බැංකුවේ අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | −13,197·2 | −15,332·4 | −15,281·5 | − 2,135·2 | | + 50·8 | |
| 3·2 වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් (ශුද්ධ) .. | −7,186·9 | −6,880·9 | −10,413·2 | + 306·0 | | − 3,532·2 | |
| 3·3 හුවමාරුවෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැලපිලි .. | 294·2 | 105·7 | 48·1 | − 188·6 | | − 57·5 | |
| **පුළුල් මුදල් සැපයුම ($M_2$)** .. | **48,408·9** | **50,860·3** | **58,335·0** | + **2,451·4** | + **5·1** | + **7,474·7** | + **14·7** |


සටහන: සලකුණු වලින් පුළුල් මුදල් සැපයුම ($M_2$) කෙරෙහි වූ බලපෑම දක්වේ.

(අ) නිර්නේවාසිකයන්ගේ විදේශීය ව්‍යවහාර මුදල් තැන්පතු ඇතුළත් නොවේ.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)

මාසිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

DISCARDED

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (රුපියල් දශලක්ෂ 1,308) සහ සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව (රුපියල් දශ ලක්ෂ 223) ද වේ. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සහ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට දෙන ලද බැංකු ණය වැඩි වීමට විශාල වශයෙන් හේතු වූයේ රාජ්‍ය වැවිලි **අංශය සංවර්ධනය** කිරීමේ අරමුණින් මැදි කාලීන ආයෝජන ව්‍යාපෘතිය (MTIP) සඵල **අන්දමින්** ක්‍රියාත්මක කිරීමයි. වැඩි වූ මිළ ගණන් යටතේ බොර තෙල් ආනයනය සහ අළුත්වැඩියා හා නඩත්තු කටයුතු සඳහා තෙල් පිරිපහදුව වසා තබන කාලය තුළදී ඇති වන ඉල්ලුම සපුරාලීම සඳහා නිමි තෙල් නිෂ්පාදන තොග තබා ගැනීම යන කරුණු දෙකම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය භාවිතය වැඩි වීමට හේතු විය. සමූපකාර තොග වෙළඳ සංස්ථාවෙහි ණය වැඩි වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය තොග ආනයනය කිරීමයි.

1986 දී වූ රුපියල් දශ ලක්ෂ 120 ක හෙවත් සියයට 9 ක වර්ධනය සමග සසඳන විට සමූපකාර ආයතනවලට දෙන ලද ණය 1987 දී රුපියල් දශ ලක්ෂ 301 කින් හෙවත් සියයට 21 කින් පහත වැටුණි. සිවිල් කෝලාහල පැවති ප්‍රදේශවල වගා කටයුතු සහ කෘෂි නිෂ්පාදිත අලෙවි කටයුතු සඳහා දුන් ණය පහත වැටීම සහ සමහර දිස්ත්‍රික්කයන්හි පැවති නියඟය මෙම අංශයන්ට දුන් ණය පහත වැටීම සඳහා හේතු විය.

1987 දී විදේශීය අංශය $M_2$ කෙරෙහි රුපියල් දශ ලක්ෂ 443 ක හෙවත් සියයට 5 ක සංකෝචනාත්මක බලපෑමක් ඇති කළේය. රටෙහි බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) පහත වැටුනු තෙවැනි වසර මෙය වූ අතර ගෙවුම් ශේෂ අතිරික්තයක් පැවති 1984 ට පසුව දිගටම පැවති ගෙවුම් ශේෂ දුර්වලතාවයන් මෙමගින් පෙන්නුම් කෙරුණි. 1985 සහ 1986 වසර වලදී බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 691 කින් හෙවත් සියයට 7 කින් සහ රුපියල් දශ ලක්ෂ 414 කින් හෙවත් සියයට 4 කින් පහත වැටුණි. 1987 දී බැංකු විදේශීය වත්කම් (ශුද්ධ) පහත වැටීම, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 621 කින් පහත වැටීමේ සහ වාණිජ බැංකුවල ශුද්ධ විදේශීය විනිමය දැරීම් රුපියල් දශ ලක්ෂ 178 කින් වැඩි වීමේත් ඒකාබද්ධ ප්‍රතිඵලයකි.

1987 ගෙවුම් ශේෂ තත්වය සැළකීමේදී, වෙළෙඳ ගිණුමෙහි සහ ජංගම ගිණුමෙහි තරමක් දුරට වැඩි දියුණු වීමක් පෙන්වීය. කෙසේ වුවද, ආධාර ගලා ඒමේ කාල පමාවන් නිසා සමස්ත ශේෂයෙහි තවදුරටත් හිඟයක් පැවති අතර, විදේශීය සංචිත අඩු කර ගැනීම මගින් එය මූල්‍යයනය කෙරුණි. මේ නිසා විදේශීය අංශයෙහි කටයුතු මුදල් සැපයුම කෙරේ සංකෝචනාත්මක බලපෑමක් ඇති කළේය.

**වාණිජ බැංකු කටයුතු**

1987 වර්ෂයේදී වාණිජ බැංකු, ද්‍රවශීලතාව පිළිබඳව මිශ්‍ර අත්දැකීම් ලදහ. වසර මුළුල්ලේම වඩාත් ඉහළ මට්ටමක ද්‍රවශීලතාවයකින් යුතු සමහර බැංකු කෙටිකාලීන ආයෝජන මාර්ගයන් කෙරෙහි යොමු වූ අතර, නොකඩවා ද්‍රවශීලතා හිඟයකට මුහුණ දුන් තවත් සමහර බැංකුවලට අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළෙන් ණය ලබා ගැනීමට සිදු විය. කෙසේ වෙතත් හිඟ ද්‍රවශීලතාවයෙන් යුක්ත බැංකු සිය අවශ්‍යතාවයන් මුළුමනින්ම වෙළෙඳපොළ මාර්ගයෙන් ලබා ගත් හෙයින් ද්‍රවශීලතාවය වැඩි කිරීම සඳහා මහ බැංකු පහසුකම් ලබා දීමට අවශ්‍ය නොවීය.

අරමුදල් සඳහා පැවති මධ්‍යස්ථ ප්‍රමාණයක ඉල්ලුම පිළිබිඹු කරමින් අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළෙහි ගණුදෙනු පහත් මට්ටමක පැවතුණි. එම වෙළෙඳපොළෙහි නොපියවා පැවති ණයෙහි මාසික සාමාන්‍යය 1987 වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 815 ක මට්ටමකට ලඟා වූයේ 1986 වසරට වඩා රුපියල් දශ ලක්ෂ 109 කින් පමණක් වැඩි වෙමිනි. මේ අතර අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතික 1986 වසර තුළ වර්ෂයකට සියයට

9.5–14.0 අතර පරතරයක උච්චාවචනය වූ අතර 1987 දී වාර්ෂිකව සියයට 5.0–21.0 අතර පරතරයක උච්චාවචනය විය. 1987 වසර තුළ පැවති තත්ත්වය සමහර බැංකුවල ද්‍රවශීලතා තත්ත්වයෙහි පැවති තියුණු උච්චාවචනයන් පිළිබිඹු කළේය.

1987 වර්ෂය තුළදී වාණිජ බැංකු කෙටිකාලීන අරමුදල් සඳහා ආකර්ශනීය ආයෝජන මාර්ගයක් වශයෙන් භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ මතු වී පෙණුනි. වාණිජ බැංකුවල භාණ්ඩාගාර බිල්පත් දැරීම 1986 අවසානයට පැවති රුපියල් දශ ලක්ෂ 1,171 සිට 1987 සැප්තැම්බර් අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 5,131 ක් දක්වා ඉහළ නැගී අතර 1987 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 3,850 දක්වා අඩු විය. මෙය එක් අතකින්, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් සඳහා පැවති සිත් ඇද ගන්නා සුළු පොළී අනුපාතිකයන්හිද, අනෙක් අතින් මෙම වෙළෙඳපොළ වර්ධනය සඳහා මෑතදී හඳුන්වා දෙනු ලැබූ සමහර ක්‍රියා මාර්ගයන්හිද ප්‍රතිඵලය විය. ද්‍රවශීලතා අතිරික්තයන් ඇද ගැනීම මෙන්ම, ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළේ මහ බැංකු විකුණුම් සඳහා වූ එළදව පහත් මට්ටමකට පත් වීමෙන් එම වෙළෙඳපොළේ කටයුතු පහළ වැටීමෙන් ඇති වූ තත්ත්වයට මුහුණ දීම අරමුණු කරගෙන සතිපතා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමද මෙම ක්‍රියා මාර්ගයනට ඇතුළත් විය. ද්විතීයික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළෙහි නොපියවා පැවති ශුද්ධ විකුණුම් 1986 වර්ෂය අවසානයට රුපියල් දශ ලක්ෂ 1,255 ක් වූ අතර, 1987 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 812 දක්වා පහත වැටුණි. වාණිජ බැංකු විසින් දරනු ලැබූ මහ බැංකු සුරැකුම්පත් අනුක්‍රමයෙන් ගෙවා නිදහස් කිරීමද වර්ෂය තුළදී ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ වෙළෙඳපොළ වර්ධනයට ඉවහල් වූ තවත් සාධකයක් විය. වාණිජ බැංකු විසින් දරනු ලැබූ මහ බැංකු සුරැකුම්පත් ප්‍රමාණය 1986 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 1,905 සිට 1987 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 60 දක්වා පහත වැටුණි.

වාණිජ බැංකු මගින් නිකුත් කරනු ලබන තැන්පතු සහතිකවල නොපියවා පැවැති ප්‍රමාණය මත පනවා තිබූ සීමාව ඉවත් කිරීම හේතුවෙන් එම තැන්පතු 1986 අවසානයේදී පැවති රුපියල් දශ ලක්ෂ 1,673 සිට 1987 අගදී රුපියල් දශ ලක්ෂ 2,032 දක්වා වැඩි වූ අතර එමගින් වාණිජ බැංකුවල සම්පත් පදනම වැඩි දියුණු කෙරුණි.

ගණුදෙනු කරුවන්ට සපයන සේවා වැඩි දියුණු කිරීම සඳහා 1987 තුළ වාණිජ බැංකු ස්වකීය සේවාවන් සපයනු ලබන පැය ගණන වැඩි කිරීම, බැංකු කටයුතු පරිගණකකරණය, මිනිස් බල සම්පත් හා පුහුණු වැඩ සටහන් වැඩි දියුණු කිරීම මගින් ගණුදෙනු කරුවන්ට සපයනු ලබන සේවාවන් වැඩි දියුණු කිරීම තවදුරටත් සිදු කරන ලදී. මේ අතර 1986 වර්ෂයේදී ස්වයංක්‍රිය ටෙලර් මැෂින් ක්‍රමය ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් බැංකුව මෙම වර්ෂය තුළදී විදේශීය ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන් සඳහාද මෙම පහසුකම් ව්‍යාප්ත කරනු ලැබීය.

1987 අවසානයේදී විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක 23 ක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක විය. මේවායේ මුළු වත්කම්/වගකීම් වසර තුළදී ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ 25 කින් පහත වැටුණි. එසේ වුවද, ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලරයට එදිරිව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණයවීම හේතුවෙන් රුපියල් අගය අනුව වර්ෂය තුළදී මුළු වත්කම්/වගකීම් වටිනාකම රුපියල් දශ ලක්ෂ 786 කින් වැඩි වී අවසානයේදී රුපියල් දශ ලක්ෂ 20,465 ක් විය. විදේශීය ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්හි කටයුතු මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ ඇති ව්‍යාපෘතිවලට සහ අනුමැතිය ලත් නේවාසිකයින්ට මූල්‍ය පහසුකම් සැලසීමේ කටයුතුවලට තවදුරටත් යොමු වී තිබුණි.

විමසුමට භාජනය වන වසර තුළ වාණිජ බැංකු සතු මුළු සම්පත්වල රුපියල් දශ ලක්ෂ 10,505 ක තියුණු වැඩි වීමක් දක්නට ලැබුණු අතර, ඒ සමග සැසඳීමේදී පසුගිය වසරේ දැකිය හැකි වූයේ රුපියල් දශ ලක්ෂ 3,937 ක පමණ අඩු වර්ධනයකි. 1987 වර්ෂයේදී වාණිජ බැංකු සම්පත්වලින් රුපියල් දශ ලක්ෂ 6,441 ක් වූ සැළකිය යුතු කොටසක් තැන්පතු රාශිකරණය

තුළින් සිදු විය. රාජ්‍ය බැංකු දෙක සතු දිගු කාලීන තැන්පතුද ඇතුළුව වාණිජ බැංකු සතු කාලීන සහ ඉතිරි කිරීමේ තැන්පතු රුපියල් දශ ලක්ෂ 4,816 කින්ද, ඉල්ලුම් තැන්පතු රුපියල් දශ ලක්ෂ 1,625 කින්ද ඉහළ ගියේය. 1987 දී වාණිජ බැංකු මගින් සිදු කළ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,789 කින් වැඩි වූ අතර, එය බැංකු අතර වූ ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 640 කින් (මහ බැංකුවෙන් ණය ගැනීම්ද ඇතුළුව) සහ විදේශයන්ගෙන් ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 1,149 කින්ද සමන්විත විය. මහ බැංකුව විසින් වාණිජ බැංකුවලට සැලසූ විවිධ ප්‍රතිමූල්‍ය පහසුකම් යටතේ ලබා ගත් ණය පහසුකම්වල ප්‍රතිඵලයක් වශයෙන් වර්ෂය තුළදී වාණිජ බැංකු මහ බැංකුවෙන් ලබා ගත් ණය රුපියල් දශ ලක්ෂ 339 කින් ඉහළ ගියේය. මේ අතර වාණිජ බැංකුවල අනෙකුත් වගකීම් සහ ගෙවා නිමි ප්‍රාග්ධනය හා සංචිත පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,929 කින් සහ රුපියල් දශ ලක්ෂ 545 කින් වර්ධනය වීම මගින් 1987 දී වාණිජ බැංකුවල සම්පත් පදනම පුළුල් විය.

ශුද්ධ පදනමක් මත වාණිජ බැංකු සතු සම්පත්වල වෙනස්කම් සහ ඒවායේ උපයෝගීකරණය 1.48 වැනි සංඛ්‍යා සටහනෙහි දක්වේ. වර්ෂය තුළදී වාණිජ බැංකු සම්පත් ශුද්ධ වශයෙන් උපයෝගී කර ගැනීමේ විශාල කොටසක්, එනම් රුපියල් දශ ලක්ෂ 3,035 ක් රාජ්‍ය අංශය විසින් සිදු කරනු ලැබීය. මේ අතර සම්පත්වලින් රුපියල් දශ ලක්ෂ 1,652 ක ප්‍රමාණයක් රාජ්‍ය සංස්ථා මගින් ප්‍රයෝජනයට ගැණුනි. විදේශීය අංශයෙහි සිදු වූ ගණුදෙනු හේතුවෙන්ද රුපියල් දශ ලක්ෂ 178 ක ශුද්ධ සම්පත් ප්‍රමාණයක් වාණිජ බැංකුවලින් ගෙවීම් ලෙස සිදු විය.

1987 දී වාණිජ බැංකු සංචිත සම්බන්ධව මහ බැංකු පිළිවෙත වෙනස් විය. සංචිත අවශ්‍යතාවයන් පහත හෙළන ලදී. භාණ්ඩාගාර බිල්පත් වඩාත් ආකර්ශනීය කරනු වස් මහ බැංකුව ස්වකීය සුරැකුම්පත් නිකුතු ද අත්හිටුවන ලදී. මේ අනුව, මහ බැංකුව මගින් වාණිජ බැංකු සම්පත් වර්ධනය කිරීම පිණිස ශුද්ධ වශයෙන් රුපියල් දශ ලක්ෂ 3,244 කින් දයක විය. මෙය, මහ බැංකුවෙන් ණය ගැනීම් රුපියල් දශ ලක්ෂ 339 කින් වැඩි වීමෙන්ද, මහ බැංකුවෙහි දරන ලද සංචිත රුපියල් දශ ලක්ෂ 1,060 කින් සහ මහ බැංකු සුරැකුම්පත් දැරීම් රුපියල් දශ ලක්ෂ 1,845 කින් පහත වැටීම හේතුවෙන් ද වූ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. වර්ෂය තුළ අන්තර් බැංකු අංශයෙන් සහ සමුපකාර ආයතනවලින් වාණිජ බැංකුවලට ශුද්ධ වශයෙන් එක් වූ සම්පත් ප්‍රමාණය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 1,216 ක් සහ රුපියල් දශ ලක්ෂ 472 ක් විය.

### 1 . 48 සංඛ්‍යා සටහන

### වාණිජ බැංකු සම්පත්හි වෙනස්වීම සහ ඒවායේ උපයෝගීකරණය

රුපියල් දශ ලක්ෂ වලිනි

| අංශය | 1985/1986 අවසානයට | 1986/1987 අවසානයට |
|---|---|---|
| 1. රජය .. .. | 297·4 | – 3,035·1 |
| 2. මහ බැංකුව .. .. | 634·0 | 3,243·9 |
| 3. රාජ්‍ය සංස්ථා .. .. | – 1,670·0 | – 1,652·0 |
| 4. සමුපකාර ආයතන .. .. | 21·5 | 472·5 |
| 5. අනෙකුත් පෞද්ගලික .. .. | – 163·5 | – 67·9 |
| 6. අන්තර් බැංකු .. .. | 705·4 | 1,216·5 |
| 7. විදේශීය .. .. | 175·2 | – 177·9 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

සටහන : අඩු කිරීමේ සළකුණින් ශුද්ධ වශයෙන් වූ සම්පත් උපයෝගීකරණය දක්වේ.

**බැංකු ව්‍යාප්තිය**

අළුතින් සංස්ථාගත කරන ලද දේශීය බැංකුවක් වූ සම්පත් බැංකු සමාගම 1987 මාර්තු මාසයේදී කොළඹදී ස්වකීය කටයුතු ඇරඹීමත් සමග ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන දේශීය බැංකු සංඛ්‍යාව පහ දක්වාද, වාණිජ බැංකු සංඛ්‍යාව 24 දක්වාද වැඩි විය. ලියාපදිංචි වූ ප්‍රසිද්ධ සමාගමක් වූ සම්පත් බැංකුව රුපියල් දශ ලක්ෂ 139 කින් යුක්ත වූ මහජන නිකුතු දෙකක් තුළින් ප්‍රාග්ධනය රැස් කළේය.

ලංකා බැංකුව ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් ප්‍රතිස්ථානගත කිරීම තුළින් ප්‍රධාන ශාඛා දෙකක් ගලේවෙල සහ රිකිල්ලගස්කඩදී විවෘත කළ අතර, කඩුවෙල ශාඛාව සමග ඔරුවල ශාඛාව ඒකාබද්ධ කළේය. ඒ අනුව, 1987 වර්ෂය අවසානයේදී ලංකා බැංකුවේ ප්‍රධාන ශාඛා ගණන 239 දක්වා වැඩි වූ අතර, ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව 49 දක්වා අඩු විය. මහජන බැංකුව සහ හැටන් නැෂනල් බැංකු සමාගම ඔවුන්ගේ මුළු ශාඛා සංඛ්‍යාව පිළිවෙලින් 298 සහ 33 දක්වා ඉහළ නංවමින් රත්නපුර නගරයේ සහ කළුතර එක් ශාඛාව බැගින් විවෘත කළේය. මේ අතර ලංකා වාණිජ බැංකු සමාගමේ ශාඛා ජාලය 15 ක් ලෙස නොවෙනස්ව පැවතුණි. තවද, 1987 වර්ෂය අවසානයේදී විදේශීය බැංකු ශාඛා සංඛ්‍යාව 23 ක මට්ටමේ නොවෙනස්ව පැවතුණි. 1987 වර්ෂය අවසානයේදී ප්‍රතිස්ථානගත ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා හැර මුළු වාණිජ බැංකු ශාඛා සංඛ්‍යාව 700 ක්ව පැවතුණි. මේ අතර, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, බොරැල්ල සහ හක්මන ශාඛා දෙකක් විවෘත කිරීමත් සමග වසර අවසානයේදී රට තුළ ක්‍රියාත්මක වූ ශාඛා සංඛ්‍යාව 62 ක් විය.

1987 වර්ෂය තුළදී කෑගල්ල, ගාල්ල, පුත්තලම සහ මහනුවර යන දිස්ත්‍රික්කයන්හි නව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු හතරක් විවෘත කිරීමෙන් මුළු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව 9 දක්වා වැඩි විය. මාතර ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව හැර අනෙකුත් සියළුම ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු විසින් වර්ෂය තුළදී තම තමන්ගේ දිස්ත්‍රික්කයන්හි ස්වකීය ශාඛාවන් විවෘත කරන ලදී. ඒ අනුව වර්ෂය අවසානයේදී ප්‍රධාන කාර්යාල ඇතුළුව දිවයින තුළ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු ශාඛා 61 ක් විය.

**1 . 49 සංඛ්‍යා සටහන**

**බැංකු ශාඛා ව්‍යාප්තිය**

| වර්ගීකරණය | 1985 | 1986 | 1987 |
|---|---|---|---|
| **1. වාණිජ බැංකු** | | | |
| 1.1 දේශීය බැංකු සංඛ්‍යාව .. | 4 | 4 | 5 |
| 1.2 ශාඛාවන් සංඛ්‍යාව (අ) .. | 671 | 676 | 677 |
| 1.2.1 ඉන් ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා සංඛ්‍යාව .. | 53 | 52 | 49 |
| 1.3 විදේශීය බැංකු සංඛ්‍යාව .. | 21 | 19 | 19 |
| 1.4 ශාඛාවන් සංඛ්‍යාව .. | 26 | 23 | 23 |
| 1.5 මුළු ශාඛා සංඛ්‍යාව (අ) .. | 697 | 699 | 700 |
| **2. ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු (ආ)** | | | |
| 2.1 ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සංඛ්‍යාව .. | 4 | 5 | 9 |
| 2.2 ශාඛාවන් සංඛ්‍යාව .. | 17 | 32 | 61 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) ව්‍යාප්ති කාර්යාල, කච්චේරි ශාඛා, ගෙවීම් කාර්යාල සහ විදේශීය ශාඛා ඇතුළත්ය. එහෙත් ප්‍රතිස්ථානගත කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන ශාඛා ඇතුලත් නොවේ.

(ආ) 1985 අංක 15 දරණ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු.

**පොළී අනුපාතිකයන්**

පසුගිය වසරේ පැවැති උපනතීන්ට අනුකූල වෙමින්, සමහර අත්තිකාරම් සහ තැන්පතු ගණයනට බලපාන පොළී අනුපාතිකයන්හි තවදුරටත් පහත වැටීම් සහිතව පොළී අනුපාතික ව්‍යූහය සුළු වශයෙන් වුවද පහත වැටීමක් පෙන්වීය. මෙය විශේෂයෙන් වර්ෂයේ ප්‍රථම භාගය තුළ, ප්‍රධාන වශයෙන් ණය සඳහා පැවැති අඩු ඉල්ලුම හේතුකොටගෙන මූල්‍ය ක්‍රමයෙහි පැවැති අධි ද්‍රවශීල තත්ත්වය තරමක්දුරට පිළිබිඹු කළේය. කෙසේ වුවද, පොළී අනුපාතිකයන් කලින් බලාපොරොත්තු තරම් පහත වැටීමට අසමත් වූයේ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් පවත්වාගෙන ගිය වර්ෂයකට සියයට 13 ක් වූ ස්ථිර තැන්පතු සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකය, පොළී අනුපාත සංශෝධනය සම්බන්ධයෙන් වඩා ආරක්ෂාකාරී ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට වාණිජ බැංකු පෙළඹවීමයි.


ජාතික ඉතිරි කිරීමේ බැංකුව ස්වකීය තැන්පතු අනුපාතිකයෙහි කිසිදු වෙනසක් සිදු නොකළද, රාජ්‍ය බැංකු දෙක මගින් විවිධ තැන්පතු වර්ග සඳහා වන පොළී අනුපාතිකයන් පහත හෙළන ලදී. නිදසුනක් ලෙස, ලංකා බැංකුව 1986 දෙසැම්බර් මාසයේදී රුපියල් 10,000 ට වැඩි ඉතිරි කිරීමේ තැන්පතු සඳහා ගෙවනු ලැබූ වර්ෂයකට සියයට 12 ක පොළී අනුපාතිකයද, එම ප්‍රමාණයට වඩා අඩු තැන්පතු සඳහා වූ වර්ෂයකට සියයට 10 ක පොළී අනුපාතිකයද, 1987 දෙසැම්බර් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි සියළුම ඉතිරි කිරීමේ තැන්පතු සඳහා වර්ෂයකට සියයට 10 ක ඒකීය පොළී අනුපාතිකයක් ලෙස හඳුන්වා දෙන ලදී. මේ අතර, රාජ්‍ය බැංකු දෙක විසින් ස්ථිර තැන්පතු සඳහා විවිධ කල්පිරීම් අනුව වූ සිය අනුපාතික, වර්ෂය අවසානයේදී සුළු වශයෙන් පහත වැටෙන අයුරින් සංශෝධනය කරනු ලැබීය.

මූල්‍ය සමාගම්, පසුගිය වර්ෂයන්හි මෙන්ම ස්ථිර තැන්පතු සහ තැන්පතු සහතික පත් සඳහා තවදුරටත් තරඟකාරී පොළී අනුපාතිකයන් පිරිනැමීය. නිදසුනක් ලෙස, වර්ෂයේ අවසාන කාර්තුව තුළදී එක් අවුරුදු තැන්පතු සඳහා ප්‍රධාන මූල්‍ය සමාගම් විසින් වර්ෂයකට සියයට 16 සිට 20 අතර පරතරයක පිහිටි පොළී අනුපාතික පිරිනමන ලද අතර වාණිජ බැංකු විසින් වර්ෂයකට සියයට 8.5 සිට 14 අතර පොළී අනුපාතික පිරිනැමීය. කෙසේ වුවද, 1987 දෙසැම්බර් මාසයේ සිට මූල්‍ය සමාගම් තැන්පතු සඳහා වන පොළී අනුපාතිකයන් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් මූල්‍ය සමාගම් පාලන පනත යටතේ නිකුත් කරන ලද නියෝගයනට අනුව නිශ්චිත සීමාවනට යටත් වුණි. මෙම නියෝගයනට අනුව, මාස දොළහක ස්ථිර තැන්පතු සඳහා ගෙවිය හැකි උපරිම පොළී අනුපාතිකය වර්ෂයකට සියයට 17 ක් වන අතර මාස දොළහ ඉක්මවන කල් පිරීමක් සහිත තැන්පතු සඳහා වන වාර්ෂික පොළිය සියයට 18 කි. කෙසේ වුවද, පවත්නා වෙළෙඳපොළ පොළී අනුපාතික අනුව ප්‍රධාන මූල්‍ය සමාගම්වලට මෙම සීමාව බාධකයක් ලෙස පැවතීමට ඉඩක් නොමැත්තේය.

වසර තුළදී කෙටිකාලීන මුදල් වෙළෙඳපොළ පොළී අනුපාතිකයන් තවදුරටත් පහත වැටීමක් පෙන්නුම් කෙරුණි. ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ තුළ පොළී අනුපාතික තීරණය වීමේ ලා වෙළෙඳපොළ බලවේගයනට වඩාත් ඉහළ කාර්ය භාරයක් ඉටු කිරීමට ඉඩ සළසන ලදී. තවද, ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් වෙළෙඳපොළ වෙත ආයෝජකයන් පෙළඹ-වීමේ අදහසින්, ද්විතීය භාණ්ඩාගාර බිල්පත් වට්ටම් කිරීමේ (විකිණීමේ) අනුපාතිකයන්ද සැළකිය යුතු ලෙස අඩු කරන ලදී. වර්ෂයේ පළමු මාස අට තුළ ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් වූ පොළී අනුපාතිකයන් බොහෝ දුරට වර්ෂයකට සියයට 8 සිට 12 අතර පරතරයක පැවතුණි. කෙසේවුවද, එතැන් පටන් සමස්ත පොළී අනුපාතික ව්‍යූහයේ පහත වැටීමේ උපනතියට අනුකූලව වර්ෂයකට සියයට 8 ත් 11 ත් අතර පටු පරතරයක මෙම අනුපාතික උච්චාවචනය විය. මේ අතර, මහ බැංකු සුරැකුම්පත් සම්බන්ධයෙන් වූ මතුපිට පොළී අනුපාතිකය 1987 මාර්තු මාසයේදී සියයට 12 සිට 11 දක්වා පහත හෙළන ලද අතර, කල් පිරීමේ කාලසීමාව මාස 6 සිට වර්ෂයක් දක්වා දිගු කරන ලදී.

# පොලී අනුපාතික

කාර්තු අවසානයට පැවති සංඛ්‍යා



පොළී අනුපාතිකයන් වෙළෙඳපොළ තත්වයන් පිළිබිඹු කිරීමේ අරමුණට එකඟව මහ බැංකු පොළී අනුපාතිකයද 1987 අගෝස්තු මාසයේදී ප්‍රතිශත අංක එකකින් අඩු කොට සියයට 10 ක මට්ටමකට ගෙන එන ලදී. එමෙන්ම, වාණිජ බැංකුවල අරමුදල් පිරිවැය අඩු කිරීමට වක්‍ර ලෙස තුඩු දුන් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් අඩු කිරීම හේතුවෙන් වාණිජ බැංකු ස්වකීය ණය දීමේ අනුපාතිකයන් තවදුරටත් අඩු කරනු ඇතැයි බලාපොරොත්තු වුණි.

සතිපතා පදනමක් මත, වාණිජ බැංකුවල බර තබන ලද ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකයේ සාමාන්‍යය සහ අවම ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තවදුරටත් පළ කරනු ලැබීය. 1987 වසර තුළදී බර තබන ලද ප්‍රමුඛ ණය දීමේ අනුපාතිකයේ සාමාන්‍යය වර්ෂයකට සියයට 13.5 සිට 15.1 අතර වූ ඉකුත් වසර හා සසඳන කල සුළු වශයෙන් අඩු පරාසයක උච්චාවචනය වූ අතර එය පසුගිය වසර තුළදී වර්ෂයකට සියයට 14.0 ත් 15.6 ත් අතර පරතරයක විය. වාණිජ බැංකුවල ණය දීමේ අනුපාතික සුළු වශයෙන් වුවද අඩු වූ බව පෙන්වීමට සාක්ෂි ඇත. නිදසුනක් ලෙස දක්වතොත් වාණිජ බැංකුවල බර තබන ලද සාමාන්‍ය ණය දීමේ අනුපාතිකය 1985 දී වූ සියයට 20.1 සිට 1986 වර්ෂය අවසානය වනවිට සියයට 19.0 දක්වා අඩු වූ අතර, 1987 වර්ෂයේ සැප්තැම්බර් මාසය අවසානයට තවදුරටත් සියයට 18.4 ක් දක්වා පහත වැටුණි. ඒ අතර, 1987 වසර තුළ දිගුකාලීන ණය දෙන ආයතනවල ණය දීමේ අනුපාතිකයන් බොහෝදුරට නොවෙනස්ව පැවතියේය.

### මහ බැංකු කටයුතු

1987 වසර අවසානයට රුපියල් දශ ලක්ෂ 45,444 ක් වූ මහ බැංකුවේ මුළු වත්කම්/වගකීම් ප්‍රමාණය පසුගිය වසරේදී සිදු වූ රුපියල් දශ ලක්ෂ 2,005 (සියයට 5) ක වැඩි වීමට බොහෝ දුරට සමාන වූ රුපියල් දශ ලක්ෂ 2,280 (සියයට 5) ක ඉහළ යාමක් පෙන්වීය.

වත්කම් අංශයෙහි, මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිතය (දළ) පිළිවෙලින් තෙවන වසරටද පහත වැටුණි. 1987 දී ජාත්‍යන්තර සංචිතය රුපියල් දශ ලක්ෂ 701 (සියයට 7) කින් පහත වැටීමට මූලිකව හේතු වූයේ විදේශයන්හි වූ මුදල් හා ශේෂ රුපියල් දශ ලක්ෂ 1,524 කින් අඩු වීමය. මේ අතර විදේශීය සුරැකුම්පත් හා භාණ්ඩාගාර බිල්පත්හි කරන ලද ආයෝජන රුපියල් දශ ලක්ෂ 820 කින් වැඩි විය.

ඉකුත් වසරේ පැවති උපනතිය අනුව යමින් මහ බැංකුවේ දේශීය වත්කම් (අනෙකුත් වත්කම් හා ගිණුම් හැර) රුපියල් දශ ලක්ෂ 1,695 කින් හෙවත් සියයට 6 කින් වර්ධනය විය. මෙම ප්‍රසාරණය සියළුම ප්‍රධාන දේශීය වත්කම් ශීර්ෂයන්හි පිළිබිඹු වුණි. රජයට දෙන ලද ණය මුදල් හා අත්තිකාරම් සහ රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත්හි කළ ආයෝජනයන් පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 643 කින් හා රුපියල් දශ ලක්ෂ 668 කින් වැඩි විය. වාණිජ බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනයන්ට දෙන ලද අත්තිකාරම්හිද රුපියල් දශ ලක්ෂ 344 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණු අතර, මෙම වර්ධනයෙන් රුපියල් දශ ලක්ෂ 87 ක් කෙටි කාලීන ණය මුදල් විය. 1987 වසර තුළදී මහ බැංකුව ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු සඳහා රුපියල් දශ ලක්ෂ 40 ක් සැපයීම හේතුවෙන් 1987 අවසානය වනවිට බැංකුව විසින් අනෙකුත් ආයතනයන් වෙත කරන ලද දයකත්වය රුපියල් දශ ලක්ෂ 200 දක්වා ඉහළ නැඟුණි. මේ අතර ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශීය විනිමය ගණුදෙනු රුපියල් දශ ලක්ෂ 873 කින් ප්‍රසාරණය වීම හේතුකොටගෙන මහ බැංකුවේ අනෙකුත් වත්කම් හා ගිණුම්ද රුපියල් දශ ලක්ෂ 1,287 කින් ඉහළ ගියේය.

වගකීම් අංශයෙහි, සංසරණයෙහි පවත්නා ව්‍යවහාර මුදල් සහ තැන්පතුවලින් සමන්විත මහ බැංකුවේ මූල්‍ය වගකීම් 1987 දී රුපියල් දශ ලක්ෂ 108 කින් සුළු වශයෙන් පහත වැටුණි. කෙසේ වුවද, වසර තුළ සංසරණයෙහි පැවති ව්‍යවහාර මුදල් රුපියල් දශ ලක්ෂ 2,200 කින් වැඩි වූයෙන් මූල්‍ය වගකීම්වල පහත වැටීමට මුළුමනින්ම හේතු වූයේ රුපියල් දශ ලක්ෂ

2,308 කින් තැන්පතු අඩු වීමය. රජයේ තැන්පතු, වාණිජ බැංකුවල තැන්පතු සහ ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන සතු තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 157 කින්, රුපියල් දශ ලක්ෂ 998 කින් සහ රුපියල් දශ ලක්ෂ 1,882 කින් අඩු විය. මෙයින් වාණිජ බැංකු සතු තැන්පතු (රුපියල් දශ ලක්ෂ 998) පහත වැටීමට හේතු වූයේ 1987 අගෝස්තු මාසයේදී ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයන් අඩු කිරීමය. මේ අතර රාජ්‍ය නියෝජ්‍යත්ව හා ආයතන සතු තැන්පතු සහ අනෙකුත් තැන්පතු පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 40 කින් සහ රුපියල් දශ ලක්ෂ 690 කින් වර්ධනය විය.

මැදි හා දිගු කාලීන ණය අරමුදල යටතේ වන ප්‍රතිමූල්‍ය ධාරිතාව ඉහළ නැංවීමේ අදහසින් යුතුව 1987 නොවැම්බර් මාසයේදී මහ බැංකුවේ පොදු සංචිතයෙන් රුපියල් දශ ලක්ෂ 250 ක් එකී අරමුදලට මාරු කිරීම නිසා මෙම අරමුදලේ මුළු සම්පත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 1,275 ක් විය. ප්‍රධාන වශයෙන් ජාත්‍යන්තර සංචිත ප්‍රති අගැයීම් ගිණුමේ ශේෂය රුපියල් දශ ලක්ෂ 1,426 කින් වැඩි වීම හේතුවෙන් වසර තුළදී මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් රුපියල් දශ ලක්ෂ 2,879 කින් වැඩි විය.

**මූල්‍ය ප්‍රතිපත්තිය**

1984 සිට ක්‍රියාත්මකව පැවති මූල්‍ය ප්‍රතිපත්තියෙහි සීමාකාරී ස්වරූපය 1987 දී තරමක්දුරට ලිහිල් කරනු ලැබීය. මෙම ලිහිල් කිරීම ප්‍රධාන වශයෙන්ම සිදු කරන ලද්දේ ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන්හි අඩු කිරීමක් සහ මහ බැංකුව විසින් සපයන ප්‍රතිමූල්‍ය පහසුකම් තවදුරටත් පුළුල් කිරීම තුළිනි. මෙලෙස මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට හැකි වූයේ මිළ ගණන් පිළිබඳව 1987 ප්‍රථම භාගයේ පැවති ස්ථාවර තත්ත්වයන් හේතුවෙනි. මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කිරීමෙන් බලාපොරොත්තු වූයේ ප්‍රමාණවත් ණය ප්‍රමාණයක් සාධාරණ පිරිවැයක් යටතේ ලබා දීමට වාණිජ බැංකුවලට ඉඩ සැලසීම මගින්, විශේෂයෙන්ම පෞද්ගලික අංශයෙහි ආර්ථික ක්‍රියාකාරිත්වය නංවාලීමය. එමෙන්ම, පොලී අනුපාතික, විශේෂයෙන්ම මුදල් වෙළෙඳ-පොළෙහි කෙටි කාලීන පොලී අනුපාතික, තීරණය කිරීමේලා වෙළෙඳපොළ බල වේගයනටද වැදගත් තැනක් පැවරුණි.

1986 දී දේශීය ණයෙහි, විශේෂයෙන්ම පෞද්ගලික අංශයට දෙන ලද ණයෙහි වර්ධනය පහත වැටීම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන, පුළුල් මුදල් සැපයුමෙහි වර්ධනය අඩු වූයෙන්, 1987 විවිධ අවස්ථාවන්හිදී ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවයන් අඩු කිරීම මගින් මූල්‍ය ප්‍රතිපත්තිය ලිහිල් කෙරුණි. 1984 අවසාන භාගයෙහි හඳුන්වා දෙන ලද ශ්‍රේණිගත පදනමක් යටතේ විශේෂ සංචිත පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය 1986 මුලදී ඉවත් කිරීමෙන් සංචිත අවශ්‍යතා ලිහිල් කිරීමේ ක්‍රියාවලිය ඇරඹුණි. 1983 සිට ක්‍රියාත්මක වූ භාවිතා නොකළ අයිරා ශේෂ වෙනුවෙන් සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාවයද 1987 ජුනි මස ඉවත් කිරීම මගින් මේ පිළිබඳව වැඩිදුරටත් පියවර ගන්නා ලදී. කෙසේවෙතත්, සංචිත අවශ්‍යතා පිළිබඳ ප්‍රධානතම සංශෝධනය කරන ලද්දේ අගෝස්තු මස මුල් භාගයේදීය. මෙහිදී ඉල්ලුම් තැන්පතු සම්බන්ධිතව සියයට 18 සිට 10 දක්වාද, දින 90 කට අඩු පරිණත වීමේ කාලසීමාවක් ඇති කාලීන තැන්පතු සඳහා සියයට 14 සිට සියයට 10 දක්වාද සංචිත අනුපාත අඩු කිරීම මගින් සියළුම වර්ගවල තැන්පතු වගකීම් සඳහා සියයට 10 ක ඒකීය සංචිත අනුපාතයක් ඇති කරනු ලැබීය. මෙම වෙනස්කම්වල ප්‍රතිඵලයක් වශයෙන්, තැන්පතු වගකීම් සඳහා අදළ සාමාන්‍ය සංචිත අනුපාතය සියයට 12.3 සිට සියයට 10 දක්වා අඩු විය. මේ අනුව, 1987 දී වාණිජ බැංකුවල මුළු තැන්පතු රුපියල් දශ ලක්ෂ 3,240 කින් ඉහළ ගොස් තිබියදීත්, 1986 අවසානයේ රුපියල් දශ ලක්ෂ 5,380 ක්ව පැවති අවශ්‍ය සංචිත ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 786 කින් හෙවත් සියයට 15 කින් අඩු වී 1987 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 4,594 ක් විය.

වර්ෂය තුළදී මහ බැංකුව ආර්ථිකයෙහි මූර්ත කටයුතු සවිමත් කිරීමේ අදහසින් වාණිජ බැංකු හා වෙනත් ඇතැම් මූල්‍ය ආයතනයන්ට ප්‍රමුඛතා අංශයන්හි කෙටි, මැදි සහ දිගුකාලීන ණය දීම් සඳහා නොකඩවා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීය. බැංකුව විසින් විවිධ ප්‍රතිමූල්‍ය ක්‍රම

යටතේ සපයන ලද නොපියවා පැවති ප්‍රතිමූල්‍ය ප්‍රමාණය වර්ෂය තුළදී රුපියල් දශ ලක්ෂ 344 කින් වැඩි වී 1987 අවසානයට රුපියල් දශ ලක්ෂ 3,496 ක් විය. මැදි හා දිගුකාලීන ණය අරමුදල යටතේ දෙන ලද ප්‍රතිමූල්‍ය පහසුකම් රුපියල් දශ ලක්ෂ 257 කින් සැළකිය යුතු ලෙස වැඩි වීම ප්‍රතිමූල්‍ය ණයෙහි වර්ධනයට විශාල වශයෙන් හේතු විය. මැදි හා දිගුකාලීන ආයෝජනයන් නංවාලීමේ අරමුණින්, මහ බැංකුවේ සාමාන්‍ය සංචිතයන්ගෙන් රුපියල් දශ ලක්ෂ 250 ක් මැදි හා දිගුකාලීන ණය අරමුදලට මාරු කිරීමද 1987 අවසානයේදී සිදු කෙරුණි. මෙමගින් අරමුදල සතු ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීමේ හැකියාව රුපියල් දශ ලක්ෂ 1,275 දක්වා වැඩි විය.

1987 ජනවාරි මස සිටම ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් එලදාව තීරණය කිරීමේ ලා වෙළෙඳපොළ බලවේග පදනම් කර ගැනුණි. මේ අතර ද්විතීය භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ එලදාව අඩු කිරීම මගින්, වාණිජ බැංකු හා වෙනත් ආයෝජකයන් ප්‍රාථමික වෙළෙඳපොළ කටයුතු කෙරේ වඩාත් යොමු කරවීමට මහ බැංකුව කටයුතු කළේය. එමෙන්ම, සතිපතා භාණ්ඩාගාර බිල්පත් නිකුතු නොකඩවා පවත්වාගෙන යාමෙන්, අතිරික්තයන් පවතින ආයතනයන්ට තම ද්‍රවශීල අරමුදල් ආයෝජනය කිරීම සඳහා ක්‍රමානුකූල පදනමක් මත කෙටිකාලීන ආයෝජන අවස්ථා ලබා දීමත් මෙමගින් සිදු කෙරුණි. මේ අතර, 1987 මාර්තු මාසයේදී මහ බැංකු සුරැකුම්පත් සඳහා වන මතුපිට පොළී අනුපාතිකය (**Coupon Rate**) සියයට 12 සිට 11 දක්වා අඩු කිරීමත්, කල්පිරීමේ සීමාව මාස හයක සිට අවුරුද්ද දක්වා වැඩි කිරීමත් සමගම ප්‍රාථමික භාණ්ඩාගාර බිල්පත් ආකර්ශනීය භාවයෙන් වඩාත් වැඩි විය. මේ අනුව, මහ බැංකු නොවන අංශ සතු භාණ්ඩාගාර බිල්පත් දැරීම 1986 අවසානයේ වූ රුපියල් දශ ලක්ෂ 4,055 සිට 1987 අවසානයට රුපියල් දශ ලක්ෂ 7,562 ක් දක්වා වැඩි විය.

1987 ජාතික ණය සැලසුමෙහි දැක්වෙන ආංශිකව ණය වෙන් කිරීමට අනුකූලව, මහ බැංකුව විසින් වර්ෂය තුළදී ණය ගලා යාමේ දිසාවන් අධීක්ෂණය කරන ලදී. පෞද්ගලික අංශයට වාණිජ බැංකු විසින් දෙනු ලබන ණය සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව යන දිගුකාලීන ණය දීමේ ආයතන හයක් සඳහා වන ණය දීමේ කටයුතු සැළැස්මට ඇතුළත් විය. වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට එනම්, රාජ්‍ය සංස්ථාවන්ට, සමූපකාර ආයතනයන්ට හා අනෙකුත් පෞද්ගලික අංශයට දෙනු ලබන ණය 1987 දී රුපියල් දශ ලක්ෂ 5,402 කින් හෙවත් සියයට 13 කින් වැඩි වීමට සැළසුම් කරන ලදී. 1986 දී මෙම අංශයට දෙන ලද ණයෙහි වර්ධනය රුපියල් දශ ලක්ෂ 2,749 ක් හෙවත් සියයට 7 ක් විය. විදේශීය අංශයෙහි ප්‍රවනතා සහ බැංකු ණය ලබා ගැනීමට රජයට ඇති අවශ්‍යතා පදනම් කරගෙන, වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට වසර අගදී දිය හැකි අනුදත් ණය සීමාව රුපියල් දශ ලක්ෂ 46,432 ක් ලෙස ඇස්තමේන්තු* කරන ලදී. ඉකුත් වර්ෂයන්හි මෙන්ම ආංශිකව ණය වෙන් කිරීමේදී කෘෂිකර්මය, අපනයන සහ කර්මාන්ත ප්‍රමුඛතා අංශ ලෙස තවදුරටත් සැළකුණි.

ණය සැළසුම් ඇස්තමේන්තු හා සැසඳීමේදී 1986 දී ණය භාවිතය අඩු මට්ටමක් දැක්වූවත්, 1987 අවසානයේදී ණය භාවිතය සැලසුමේ ඉලක්කයට වඩා රුපියල් දශ ලක්ෂ 2,236 කින් හෙවත් සියයට 5 කින් වැඩි විය. කෘෂිකාර්මික අරමුණු විශේෂයෙන්ම රාජ්‍ය අංශයේ වතු සංවර්ධනය සඳහා වූ මධ්‍ය කාලීන ආයෝජන වැඩසටහන යටතේ වූ ඉහළ ණය භාවිතය මේ තත්ත්වයට මුළුමනින්ම වාගේ හේතු විය. මෙම ණය පිළිබඳ සැහෙන වර්ධනයක් වසරේ අවසාන කාර්තුවේදී දක්නට වූ අතර, ඒ අනුව ණය සැළැස්මේ ඉලක්ක අභිබවා වැඩියෙන් ණය භාවිතා කිරීමක්ද මේ කාලපරිච්ඡේදයේ දක්නට විය. ආයතනයන්ගේ වර්ධනය මෙන්ම ප්‍රමුඛ අවශ්‍යතාවන්හි ප්‍රසාරණයද සමහර අවස්ථාවලදී ණය අවශ්‍යතාවන් ආංශික පදනමක් මත පුරෝකථනය කිරීම දුෂ්කර කටයුත්තක් බවට පත් කරයි.

* ජාතික ණය සැළසුමෙහි, පෞද්ගලික අංශයට දෙනු ලබන ණය පිළිබඳ නිර්වචනය, මූල්‍ය සමීක්ෂණ නිර්වචනයෙන් වෙනස්වේ. එසේ වනුයේ ජාතික ණය සැළසුමෙහි නිර්වචනයට අපනයන බිල්පත් ඇතුළත් වන අතර, හුවමාරු වෙමින් පවතින මුදල් ශීර්ෂ හා පෞද්ගලික අංශයෙහි සමාගම්වල වාණිජ බැංකු විසින් කරන ලද ආයෝජන ඇතුළත් නොවන හෙයිනි.